00609

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන- 4වන මට්ටම
අවසාන පරීක්ෂණය 2023/2024
**EPU4534- මුල් ළමාවිය සහ ප්‍රාථමික පාසල් අවධියේ සමායෝජීවීමේ ගැටලු**
කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.06.21 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ ඇති සියලුම ප්‍රශ්නවලටද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.

## 1 - වන කොටස

01. මුල් ළමාවියේ දරුවන්ට අදාළව "සමයෝජී ගැටලු" යන පදය නිර්වචනය කරන්න, තවද DSM- වර්ගීකරණය මත පදනම්ව රෝග විනිශ්චය නිර්ණායක දෙකක් (02) විස්තර කරන්න.

02. මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය තුළදී දරුවන්ට වැඩිහිටි වියේදී අභියෝගාත්මක තත්ත්වයන් සමඟ කටයුතු කරන විට මුහුණ දීමට සිදුවිය හැකි බාධා දෙකක් (02) නම් කරන්න.

03. පියාජේ ගේ ප්‍රජානන සංවර්ධන න්‍යායේ සඳහන් ප්‍රධාන අදියර හතර (04) ලැයිස්තුගත කරන්න. ඉන් එක් අදියරක් තෝරා ගෙන සුදුසු උදාහරණ සමඟ එය පැහැදිලි කරන්න.

04. දරුවෙකුගේ අධ්‍යයන කාර්ය සාධනයට හෝ සමාජ හැසිරීමට බලපාන ආතති සහගත ජීවන සිදුවීම් දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

05. පාසල් පරිසරයකින් සැබෑ ජීවිත උදාහරණ යොදා ගනිමින්, සමයෝජී ගැටලු ඇති දරුවන් තුළ බහුලව දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් (02) පැහැදිලි කරන්න.

06. සමයෝජී ගැටළු හේතුවෙන් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් තුළ තිබිය හැකි චිත්තවේගීය හෝ චර්යාත්මක ලක්ෂණ පහක් (05) ලැයිස්තුගත කරන්න.

07. සමයෝජී ගැටළු අත්විඳින දරුවන්ට සහාය වීම සඳහා ප්‍රාථමික පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කළ හැකි ඵලදායී ඉගැන්වීමේ උපාය මාර්ග දෙකක් (02) විස්තර කරන්න.

08. මුල් ළමාවිය තුළ දී පාරිසරික සාධක සමයෝජී ගැටළු සඳහා දායක වන්නේ කෙසේදැයි නිශ්චිත උදාහරණ තුනක් (03) සපයමින් සාකච්ඡා කරන්න.

ලකුණු 05 X 08 =40

## 02 - වන කොටස

09. පන්ති කාමරය තුළ සිටින නිතර ආක්‍රමණශීලී බව සහ දුක් සහගත තත්ත්වය පෙන්වන සිසුවෙකුට ඔබ උගන්වන බව සිතන්න.

I. මෙම චර්යාත්මක ගැටළු සඳහා හේතුවිය හැකි මනෝවිද්‍යාත්මක හෝ පාරිසරික හේතු දෙකක් (02) සඳහන් කරන්න. (ලකුණු 05)

II. 'එරික්සන්ගේ මනෝ සමාජීය සංවර්ධන න්‍යාය' මත පදනම් ව, උත්පාදන ශක්තියට එරෙහිව දෝෂත්ව හැඟීම' (initiative vs. Guilt) යන අවධියේ දී විසඳා නොගත් ගැටුම් ප්‍රාථමික පාසල් දරුවන්ගේ සමයෝජී ගැටළු වලට තුඩු දෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. සමයෝජී ගැටළු අත්විඳින සිසුන්ට සහාය වීම සඳහා පන්ති කාමරයේ මනෝ සමාජීය පරිසරය කළමනාකරණය කිරීමට ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)



107

10. I. පන්ති කාමර කළමනාකරණයේ අන්‍යෝන්‍යතා බව (reciprocity) යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 05 )

II. සමයෝජී ගැටළු සහිත දරුවන් ඵලදායී ලෙස හැසිරවීමට ගුරුවරුන් සංවර්ධනය කර ගත යුතු නිපුණතා තුනක් (03) පැහැදිලි කරන්න. සුදුසු උදාහරණ සමඟ ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 07 )

III.ගුරුවරයෙකු ලෙස, ඔබ පන්ති කාමරයේදී අන් අයගෙන් ඈත් ව සිටින සහ කලාතුරකින් කතා කරන දරුවෙකු සමඟ කටයුතු කරයි.
මෙම සිසුවාගේ සමයෝජී වීම සඳහා සහාය වීමට 'බන්දූරාගේ සමාජ ඉගෙනුම් න්‍යාය' මත පදනම්ව විශේෂිත උපාය මාර්ග හතරක් (04) සංවර්ධනය කරන්න. (ලකුණු 08 )

11. I. නිරෝගී සමවයස් මිතුරන්ගේ අන්තර් ක්‍රියාකාරිත්වය, පන්ති කාමර පරිසරයක් තුළ ළමයින්ගේ සමාජ සංවර්ධනයට බලපාන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් (02) සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 05 )

II. ගුරුවරයෙකු ලෙස, සමයෝජී ගැටළු වලට මුහුණ දෙන සිසුවෙකුට සහාය වීමට ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකම් භාවිත කරන්නේ කෙසේදැයි විස්තර කරන්න. අවම වශයෙන් උපාය මාර්ග තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 07 )
III. "සමහර විට දරුවන් ඔවුන්ගේ චර්යාත්මක වෙනස්කම් නිසා සම වයසේ මිතුරන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ" සම වයසේ මිතුරන්ගේ ප්‍රතික්ෂේප කිරීම වැළැක්වීමට සහ අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීමට ගුරුවරයාට සිදුකළ හැකි මැදිහත්වීම් හතරක් (04) පැහැදිලි කරන්න. (ලකුණු 08 )

12. I. පවුල් ආශ්‍රිත ගැටළු නිසා ඇතිවන චිත්තවේගීය ආතතිය සමඟ සාර්ථකව කටයුතු කිරීමට දෙමාපියන්ට හෝ රැක බලා ගන්නන්ට දරුවන්ට උපකාර කළ හැකි ක්‍රම දෙකක් (02) විස්තර කරන්න.(ලකුණු 05 )

II. ගුරුවරුන් බොහෝ විට සමයෝජී ගැටළු වල මූලික ලක්ෂණ නිරීක්ෂණය කරයි. එවැනි ලක්ෂණ හතරක් (04) හඳුනාගෙන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)
III. ළමයින් අතර සමයෝජී ගැටළු විසදීම සඳහා ලබා ගත හැකි සේවා හතරක් (04) සඳහන් කරන්න. එක් එක් සේවාවන් දරුවන්ට සහය වීමට යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 )

13. චිත්‍රා 7 හැවිරිදි සිසුවියක් වන අතර ඇය ලිවීමේ දුෂ්කරතා පෙන්වයි.
ඇය ගණිතයට දක්ෂ වුවද, සිංහල අකුරු ලිවීමේදී සහ අක්ෂර වින්‍යාසයේ නිරන්තරයෙන් වැරදි සිදු කරයි. ඇගේ ගුරුවරයා ඇය කම්මැලි සහ නොසැලකිලිමත් ලෙස සලකයි, නමුත් චිත්‍රාගේ දුෂ්කරතා ඩිස්ලෙක්සියා වැනි ඉගෙනුම් ආබාධයක් විය හැක.

1. චිත්‍රා අත්විඳින ඉගෙනුම් දුෂ්කරතා මොනවාද, එය ඩිස්ලෙක්සියා රෝග ලක්ෂණ විය හැක්කේ මන්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 05 )
2. ගුරුවරයෙකුට කම්මැලිකම සහ ඉගෙනුම් ආබාධයක් අතර වෙනස හඳුනා ගන්නේ කෙසේද?උදාහරණ තුනක් (03) සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 07)

3. පන්ති කාමරය තුළ චිත්‍රාගේ ලිවීමේ කුසලතා වැඩිදියුණු කිරීමට උපකාර වන ඉගැන්වීමේ උපාය මාර්ග තුනක් (03) ලැයිස්තුගත කර පැහැදිලි කරන්න. (ලකුණු 08 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



///